**අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාව.**

**ගාල්ල දිස්ත්‍රික්කය**

**---------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 අප්‍රේල් 06 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 17 දින ද, විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 ජුනි 30 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | හිඟ බදු අයකර ගැනීමට පවරා තිබුණු නඩු කටයුතු අවසන් වී නොතිබියදී, සතිපොලේ හිඟ බදු කුලී රු.500,555 ක් සහ අනෙකුත් හිඟ බදු කුලී රු.278,780 ක් සමුච්චිත අරමුදලින් කපා හැර තිබුණි. | විධිමත් අනුමැතියක් තිබිය යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂය සඳහා විගණන ගාස්තු වෙනුවෙන් ගිණුම් වල ප්‍රතිපාදන ඇතිකර නොතිබුණි. | ප්‍රතිපාදනයන් ඇතිකල යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**1.3.2 නොසැසඳුනු ගිණුම්**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 04 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන / උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.4,889,885 ක වෙනසක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | කාලයක සිට පවතින අසමාන -තාවයන් බැවින් ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**1.3.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

**තොරතුරු ඉදිරිපත් නොකිරීම**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| රු.206,210,723 ක් වූ ගිණුම් විෂයයන් 07 ක් සඳහා අවශ්‍ය තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**1.4 අනුකූල නොවීම්**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| | **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට යොමුව** | **අනුකූල නොවීම** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- | --- | --- |
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත134 (1) වගන්තිය | සංවර්ධනය කල ප්‍රදේශ වශයෙන් ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශ වලින් වරිපනම් බදු අය කිරීමට කටයුතු කර නොතිබුණි. | වගන්ති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛ<br>------------------- | | | |
| (i) | 2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/පපාකො/2010/01 දරන චක්‍රලේඛයේ 05 ඡේදය | කඩ කාමර සම්බන්ධයෙන් වූ බදු ගිවිසුම් වසර 03 කට වරක් යාවත්කාලීන කරමින් සංශෝධනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | 06 ඡේදය | වසර 05 කට වරක් කඩ කාමරවලට අදාළ බදු මුදල නව තක්සේරුවක් මඟින් සංශෝධනය කර ක්‍රියාත්මක කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි<br>------------------- | | | |
| (i) | මුදල් රෙගුලාසි 570,571 හා 572 | තැන්පත් කළ දින සිට වසර 02 ක කාලයක් ඉක්මවූ තැන්පතු 47 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | මුදල් රෙගුලාසි 1645 හා 1646 | සභාව සතු වාහන සම්බන්ධ දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**2 මූල්‍ය සමාලෝචනය**

**--------------------------**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

**----------------**

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.9,866,340 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.14,316,879 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්,රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| අක්කර බදු | 1,000 | 17,215 | 2,297 | 257,726 | 8,850 | 17,115 | 3,517 | 242,147 |
| කුලී | 2,500,000 | 2,173,738 | 1,529,025 | 1,004,659 | 2,320,350 | 2,698,883 | 3,003,751 | 363,882 |
| බලපත්‍ර ගාස්තු | 1,331,000 | 1,287,440 | 1,148,310 | 564,600 | 1,380,300 | 1,479,240 | 958,730 | 553,910 |
| | 3,832,000 | 3,478,393 | 2,679,632 | 1,826,985 | 3,709,500 | 4,195,238 | 3,965,998 | 1,159,939 |

### 2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.6,269,491 ක් හා මුද්දර ගාස්තු රු.50,115,698 ක් විය. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කරමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතුවේ. | ඉදිරියේ දී වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට කටයුතු කරමි. |

**(ආ) අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (i) බටපොල දෙමහල් වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 14 ක් 1997 වර්ෂයේ සිට සභා තීරණයක් මත කුලී පදනම මත ලබා දී තිබුණි. 2013 සහ 2015 වර්ෂවලදී තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලබාදුන් තක්සේරු වටිනාකම්වලට කඩ හිමියන් විරෝධය දැක්වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු.596,400 ක ආදායමක් අහිමි වී තිබුණි. | තක්සේරුව ක්‍රියාත්මක කළ යුතුවේ. | හිඟ මුදල් කඩිනමින් අයකර ගන්නා බව දන්වමි. |
| (ii) මීටියාගොඩ වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 2015 වර්ෂයේ සිට කුලී පදනම මත ලබා දී තිබූ නමුත්, එකී කඩ කාමර සඳහා නව තක්සේරුවක් ලබා ගැනීම හා සෑම වසර 03 කට වරක් බදු ගිවිසුම් යාවත්කාලීන කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් උපයාගැනීමට තිබුණු ආදායම් අහිමිවී තිබුණි. | ආදායම් නිවැරදිව අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ඇ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| දෙල්ගහබැද්ද කාබනික පොහොර නිෂ්පාදන අංගනයේ සවිකර තිබෙන කසළ ඇඹරුම් යන්ත්‍රය අක්‍රිය වී තිබීම හේතුවෙන් කසළ අංගනය තුළ දිරන ලද කසළ ගොඩගැසී තිබුණි. වැසි දින වල දී මෙම අපද්‍රව්‍ය ආසන්නයේ ඇති වෙල්යායට ගසා ගෙන යාම සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | කසළ බැහැර කිරීම සඳහා විධිමත් හා දීර්ඝකාලීන වැඩපිළිවෙලක් සකස් කළ යුතුවේ. | කසළ ඇඹරුම් යන්ත්‍රය අළුත්වැඩියා කරන බව දන්වමි. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ, තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුලින් සහා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නැංවීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන සඳහා වන දීර්ඝකාලීන සැලසුම් සකස් කර ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කළ යුතුවේ. | බල ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවීමට ඉදිරියේ දී සැලැස්මක් සකස් කරන බව දන්වමි. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පොදු සුසාන භූමි පවරා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර තිලකපුර හා නින්දාන සුසාන භූමිවල අනවසර පදිංචිකරුවන් ස්ථිර නිවාස තනාගෙන පදිංචි වී තිබුණි. | පොදු සුසාන භූමිවල අයිතිය විධිමත් පරිදි ලබා ගත යුතුවේ. | පොදු සුසානභූමි පවරා ගැනීමට කටයුතු කරමි. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **(අ) සේවක පුරප්පාඩු හා අතිරික්තතා** | | |
| තනතුරු 14 ක පුරප්පාඩු පිරවීමටත්, තනතුරු 14 ක අතිරික්තය හා අනියම් හා ආදේශක තනතුරු 15 ක් විධිමත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පුරප්පාඩු විධිමත්ව බඳවා ගැනීමටත්, අතිරික්ත තනතුරු විධිමත් කර ගැනීමටත් කටයුතු කළ යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ආ) සේවක ණය**

-------------------

| | | |
|---|---|---|
| විශ්‍රාම ගිය, විදේශගත වූ, සේවය හැර ගිය හා මිය ගිය සේවකයින් 11 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු සේවක ණය ශේෂය රු.195,900 ක් විය. | හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | හිඟ ණය ශේෂ ඉදිරියේ දී අයකර ගැනීමට කටයුතු කරමි. |

## 4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

---------------------------------------------

### 4.1 අභ්‍යන්තර විගණනය

-------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී ප්‍රමාණවත් විගණනයක් සිදුකර නොතිබුණි. | ප්‍රමාණවත් අභ්‍ය7න්තර විගණනයක් සිදුකළ යුතුවේ . | ඉදිරියේ දී අභ්‍යන්තර විගණනයක් සිදුකර වාර්තා එවීමට කටයුතු කරමි. |

### 4.2 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම

-----------------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමට සමාලෝචිත වර්ෂය අවසානයට ද කටයුතු කර නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටු පිහිටු විය යුතු වේ. | ඉදිරියේ දී කටයුතු කරමි. |